රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 43/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 අගෝස්තු මස 21 වැනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

ගංවතුර හේතුකොටගෙන සේවයට නොපැමිණි රජයේ නිලධාරීන් සඳහා විශේෂ නිවාඩු ලබා දීම.

වැහකඩ, කෑගල්ල, ගම්පහ, කොළඹ, රත්නපුර, කලුතර, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කවල අති වූ ජල ගැලීම් හා ගංවතුර හේතුකොටගෙන සේවයට වාර්තා කිරීමට අපොහොසත් වූ රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතු බැව් දන්වමි.

02. ජල ගැලීම් හා ගංවතුර හේතුකොටගෙන පොදු ප්‍රවාහන සේවා පහසුකම් නොවැතිවීම නිසා සේවයට පැමිණීමට නොහැකිවීම පිළිබඳව විශේෂ නිවාඩු ඉල්ලීම් ගැන සලකා බලිය යුත්තේ එම නිලධාරීන්ට සේවයට පැමිණීමට නොහැකි වූයේ ඒ ඒ නිලධාරීන් පදිංචි වී සිටි ප්‍රදේශයේ, සේවා ස්ථානයත් අතර ඇති පොදු ප්‍රවාහන සේවාවන් එම සේවා ස්ථානවලට යාමට නොහැකි වන පරිදි ගංවතුර හේතුවෙන් තහර කර තිබූ නිසා බව සනාථ කිරීමට ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරිගෙන් සහ ප්‍රදේශය භාර ග්‍රී.ලං.ග.ම. ඩිපෝ අධිකාරිගෙන් ලබා ගන්නා ලද සහතික ඉදිරිපත් කළහොත් පමණි.

03. එවා නිවැරදි බවට පෞද්ගලිකවම සොයා බලා ආයතන ප්‍රධානියාට සෑහීමට පත්වීමට හැකි නම් පමණක් ගංවතුර වෙනුවෙන් විශේෂ නිවාඩු අනුමත කිරීමට ආයතන ප්‍රධානියාට පුළුවන.

04. මෙම අනුශාසන වැහකඩ පැවැති ගංවතුර වෙනුවෙන් පමණක් සීමා වන බව සැලකිය යුතුය.

(එච්.එම්. ජයසිරි)
රාජ්‍ය පරිපාලන රාජ්‍ය ලේකම්,
හා අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.